# චින්තනයේ හා සංස්කෘතියේ වැදගත්කම

දැනුම් ආධිපත්‍යය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ යම් දනුමක් මේ ලිපි පෙළ කියවන්නන්ට දැන් ලැබී ඇතැයි සිතමි. බටහිර දැනුම අප මත අධිපතිවාදී ආකාරයකින් පැටවීමේ දී යොදාගන්නා එක් කරුණක් වන්නේ බටහිර දැනුම එකම සත්‍ය දැනුම බව ය. සත්‍ය දැනුම යනු බටහිර නිර්මාණය කෙරෙන බටහිර (ස්වාභාවික) විද්‍යාව හා ඒ පසුපස යන බටහිර සමාජයීය විද්‍යා හා මානව ශාස්ත්‍ර ය. අනෙක් දැනුම් එක්කෝ ඊනියා සාම්ප්‍රදායික දැනුම් යැයි නම් කෙරී බාල්දු කෙරෙයි. එසේත් නැතහොත් මිථ්‍යාවන් ලෙස ගැනෙයි.

බටහිර දැනුම පමණක් සර්වකාලීන ලෝකයට ම පොදු දැනුම ලෙස ඉදිරිපත් කෙරෙයි. අප කලින් ද සඳහන්කර ඇති පරිදි ඒ දැනුම ඉදිරිපත් කෙරෙන්නේ ඊනියා වාස්තවික දැනුමක් ලෙස ය. ඒ නිරීක්ෂකයාගෙන් ස්වායත්ත දැනුමක් යැයි ද ඉන් ඊනියා යථාර්ථය හෙළිවන්නේ යැයි ද බටහිරයෝ අපට කියා දෙති. යථාර්ථයක් හෙළිකරන ඊනියා වාස්තවික දැනුමක් ලෙස එවිට ඒ දැනුම ලෝකයාට ම පොදු වෙයි. එහෙත් ඒ දැනුම බටහිරයන්ට, එනම් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ බටහිරයන්ට, සාපේක්ෂ වූ දැනුමක් බව ඔවුහු අපට නො කියති. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයේ, යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියේ දැනුම මුළු ලෝකයට ම පොදු දැනුමක් බව ලෝකයාට ම ඒත්තු ගන්වා ඇත්තේ බටහිර යටත්විජිතවාදය ඔස්සේ ය.

මෙහි දී ඇතැම් පඬියකු තම පඬි බව පෙන්වමින් බටහිර විද්‍යාත්මක දැනුම සර්වකාලීන නොවේ යැයි ද ඒ කලින් කලට වෙනස්වන්නේ යැයි ද කියනු ඇත. උදාහරණයක් ලෙස ආලෝකය ගමන්කිරීම පිළිබඳ නිව්ටන්ගේ ලවක ප්‍රවාදය (corpuscular theory) පසුව තරංග ප්‍රවාදය (wave theory) මගින් විස්ථාපනය වූ ආකාරය ඔවුන් පෙන්වා දෙනු ඇත. ඒ අර්ථයෙන් ගත්කල බටහිර ප්‍රවාද සර්වකාලීන නො වේ. නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය වෙනුවට අද ඇත්තේ අයින්ස්ටයින්ගේ සාධාරණ සාපේක්ෂතා ප්‍රවාදය ය. බටහිර දැනුම සර්වකාලීන වන්නේ ඒ අර්ථයෙන් නොවන බව පැහැදිලි ය. ඒ ඒ ප්‍රවාද පිළිගැනෙන කාලය සීමිත වුවත් ප්‍රවාද එකට ගත්විට ඒ සෑම කාලයකට ම පොදු වෙයි. බටහිර දැනුම සර්වකාලීන යැයි කියැවෙන විට ඒ ඒ ප්‍රවාදය නොව සමස්ත දැනුම ම එකට ගැනෙයි.

ඒ තවදුරටත් ඊනියා සාම්ප්‍රදායික දැනුම (traditional knowledge) සමග සංසන්දනය කිරීමෙණ් දත හැකි ය. එහි දී සාමාන්‍යයෙන් පහත සඳහන් කරුණු සාම්ප්‍රදායික දැනුම සම්බන්ධයෙන් කියැවෙයි. සාම්ප්‍රදායික දැනුම ලෙස ඉදිරිපත් කෙරෙන දැනුම එක්තරා කාලයකට එක්තරා දේශයකට පමණක් සීමා වෙයි. බටහිරයන් පැමිණීමට පෙර ලංකාවේ පැවති දැනුම එකල ලංකාවට පමණක් සීමා වෙයි. ඒ දැනුම ලංකාවේ වුවත් අදට වලංගු දැනුමක් නො වෙයි. සාම්ප්‍රදායික දැනුම යල්පැනගිය දැනුමක් වෙයි. බටහිර ඇතැම් ප්‍රවාදයක් යල්පැනගිය එකක් විය හැකි ය. එහෙත් බටහිර දැනුම සමස්තයක් ලෙස යල්පැන නො යයි.

අද ඇතැම් විට ඊනියා සාම්ප්‍රදායික දැනුම භාවිතා නොකරන්නේ දැයි මෙහි දී ප්‍රශ්නයක් මතු විය හැකි ය. අපි උදාහරණයක් ලෙස භාවනාව ගනිමු. අද බටහිරයෝ ද භාවනාව යොදා ගනිති. එහෙත් බටහිරයන් භාවනාව යොදා ගන්නේ බෞද්ධයන් මෙන් නිවන් දැකීම මුල් කරගෙන හෝ වෛදිකයන් යෝග අභ්‍යාස කරන ආකාරයට බ්‍රහ්මන් සමග එක්වීමට බලාපොරොත්තුවෙන් හෝ නො වෙයි. (බ්‍රහ්මන් සමග එකතුවීම යන්න ම අද්වෛත වේදාන්තයට අනුව වැරදි ය. අපි මෙහි දී එවැනි සියුම් තැන් පසෙකට දමමු.) බටහිරයන්ට භාවනාව අවශ්‍ය වන්නේ මමත්වය වැඩිකර ගැනීමට මිස අඩු කිරීමට හෝ නැති කිරීමට හෝ නො වෙයි.

අද බටහිරයන් අතර භාවනාව ඊනියා සාම්ප්‍රදායික දැනුමකට අයත් වූවක් නො වෙයි. ඔවුන් දඹදිව, භාරතයේ (ඉන්දියාව, භාරතය, දඹදිව යනු එක ම රටක් නො වේ.) බටහිරයන් ඊනියා සාම්ප්‍රදායික දැනුමක තිබූ භාවනාව ඔවුන්ගේ සංස්කෘතියට අවශෝෂණය කරගෙන ඒ ඔවුන්ගේ දැනුමක් බවට පත්කරගෙන ඇත. දැන් භාවනාව, එනම් බටහිරයන්ගේ භාවනාව ලෝකයට ම පොදු වූවකි. බටහිරයන් විසින් ම ඇතිකරන ලද සමාජයීය වෙනස්කම්වල ප්‍රතිඵලයක් ලෙස අද ඇති මානසික ආතති සමනය කිරීමට භාවනාව යොදා ගැනීම හා ආනාපානසතිය වැඩීම අතර ඇත්තේ කෙතරම් වෙනසක් ද?

© Prof. Nalin De Silva

මිථ්‍යා ලෙස සලකා ඉවත දැමෙන දැනුම ගැන අපි කතා නො කරමු. මේ මිථ්‍යා යනුවෙන් හඳුන්වන්නේ ද මිනිසුන් විසින් යම් ප්‍රශ්නවලට දෙන ලද, එනම් නිර්මාණය කරන ලද පිළිතුරු වෙයි. ඒවාට යම්කිසි පදනමක් වෙයි. සිංහබාහු කතාව මිථ්‍යාවක් ලෙස බොහෝ දෙනා සලකති. එහෙත් සිංහබාහු කතාව ද වෙනත් බටහිර විද්‍යා කතා මෙන් ම ප්‍රවාදයක් බව අපි කලෙකට ඉහත දී පෙන්වා දුන්නෙමු. නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණ ප්‍රවාදය ද යම් ප්‍රශ්නයකට දෙන ලද පිළිතුරක් පමණක් වෙයි. අයින්ස්ටයින් පඬිවරයාගෙන් පසුව අවශ්‍ය නම් නිව්ටන්ගේ ගුරුත්වාකර්ෂණ ප්‍රවාදයට ද මිථ්‍යාවක් යැයි කිව හැකි ය.

මේ ලිපි පෙළෙහි අරමුණ බටහිර දැනුම යනු තවත් එක් දැනුමක් මිස එකම දැනුම නොවන බව පෙන්වා දීමත් විවිධ ක්ෂෙත්‍රවල අපේ සංස්කෘතිය මත පදනම් ව අපේ ප්‍රවාද නිර්මාණය කිරීමත් ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වය පිළිබඳ ව ම අපේ ප්‍රවාදයක් වෙයි. ඒ ඇතිවුණේ කෙසේ ද එහි පදනම කුමක් ද ආදිය අපි දැනටමත් සාකච්ඡා කර ඇත්තෙමු. මුළු මහත් බටහිර සමාජය ම අද බටහිර ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය මත පදනම් වෙයි. ඒ චින්තනය පළමුවෙන් ඉතාලියේ නිර්මාණය වී පසුව උතුරු යුරෝපයට ගලා ගියේ ය. ඒ චින්තනය මත පදනම් ව යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය බිහි විය. මේ චින්තනයෙහි හා සංස්කෘතියෙහි සමාජය (සමස්තය) වෙනුවට පුද්ගලයා ඉස්මතු වීම, පෞද්ගලික ඉන්ද්‍රිය පිනවීමට ඉඩකඩ සැපයීම හා අවශ්‍ය පසුබිම සකස්කිරීම, පෞද්ගලිකත්වය වර්ධනය කිරීම, පුද්ගලයන් එකිනෙකාගෙන් වෙන්කිරීම, ද්‍රව්‍ය ද අනෙක් ද්‍රව්‍යයන්ගෙන් වෙන්කිරීම, පුද්ගලයන් ද්‍රව්‍යයෙන්, විශේෂයෙන් ඉඩමෙන් වෙන් කිරීම, මනස හා ද්‍රව්‍ය වෙන් කිරීම, එසේ වෙන් කරන කාටීසීය තාප්පය, සංයුක්ත චින්තනය වෙනුවට වියුක්ත චින්තනය යොදා ගැනීම, සංස්ලේෂණයට වඩා විශ්ලේෂණය වැදගත් ලෙස සැලකීම ආදිය වෙයි. මේ අතර යම් යම් ආකල්ප ද වෙයි.

බටහිර විද්‍යාව, රෙපරමාදු ප්‍රතිසංස්කරණය හා විවිධ ක්‍රිස්තියානි ආගම්, ධනපති ක්‍රමය ආදිය බිහිවුයේ මෙවැනි පසුබිමක ය. ස්වසිද්ධාත්මක විධි ක්‍රමය, ඌනිත වාදය, ආදිය ද කලින් සඳහන් කළ ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි හා යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි ප්‍රතිඵල වෙයි. ඒ චින්තනයෙහි න්‍යාය ඇරිස්ටෝටලීය න්‍යාය වෙයි. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනය රේඛීය චින්තනයක් වෙයි. අපේ ප්‍රවාදවලට අනුව ආගමක් විසින් සංස්කෘතියක් බිහි කෙරනු නොව සංස්කෘතියක් විසින් ආගමක් බිහි කෙරෙයි. බටහිර රෙපරමාදු ප්‍රතිසංස්කරණය ඇති වී ක්‍රිස්තියානි සංස්කෘතියක් බිහි වුවා නොව පහළොස්වැනි සියවසේ ඇරඹුණු විනාතන විප්ලවයක විහි වූ සංස්කෘතියක් මගින් ක්‍රිස්තියානි ආගම් ඇති කෙරිණි. මින් අදහස් කරන්නේ ආගම් ඇතිවීමෙන් පසුව ඒ ආගම් විසින් ඒ බිහි කෙරුණු ලැබූ සංස්කෘතීන් වෙනස් නො කරනවා යන්න නො වේ.

එවැනි නිගමනයකට එළඹිය හැක්කේ රේඛීය චින්තනයක ය. ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙහි මුලක් ඇත. එවැනි චින්තනයක සංස්කෘතියකින් ඇතිවන ආගමක් විසින් සංස්කෘතිය වෙනස් කෙළෙන්නේ යැයි නො කිව හැකි ය. එහෙත් සිංහල බෞද්ධ චින්තනය චක්‍රීය වෙයි. සංස්කෘතියක පැන නගින ආගමකට පසුව සංස්කෘතිය ද වෙනස් කළ හැකි ය. අපේ ප්‍රවාදවලට අනුව බුදු දහම බිහිවුයේ අර්ධ වෛදික සමාජයක එහෙත් ප්‍රාග් ආර්ය සංස්කෘතියක් පසුබිම් කරගනිමිනි. ලෞකික වශයෙන් ගත්කල වුදු දහමින් පහර වැදුනේ බමුණන්ට හා වෛදිකයන්ට ය. සිදුහත් කුමරු උපන්නේ ආර්ය සංස්කෘතික ආධිපත්‍යයට ක්‍රමයෙන් යටවීම ඇරඹුණු අනාර්ය සමාජයක ය. එතුමා මූලික වශයෙන් පදනම් වුයේ අනාර්ය සංස්කෘතියක ය. (අනාර්ය යනු ද්‍රවිඩ නොවන බව දූහුනන් දැනුම් උදෙසා අවධාරණය කළ යුතු ය.) අනාර්ය සංස්කෘතියක ඇතිවුණු බුදු දහම ඒ සමාජයට ද බලපෑම් කිරීමට සමත් විය.

අප කලින් ද සඳහන් කර ඇති ආකාරයට බුදුන් වහන්සේ එකල ආර්යයන් විසින් යොදා ගනු ලැබුණු ඇතැම් සංකල්පවලට වෙනත් අර්ථකථන දුන්හ. ආර්ය හා බ්‍රාහ්මණ යන පදවලට පවා උන්වහන්සේ වෙනත් අර්ථකථන දුන්හ. උන්වහන්සේට ආර්ය යනු ගෝත්‍රික නාමයක් නො වී ය. උන්වහන්සේ ගේ ආර්යයෝ නිවන අපේක්ෂා කළහ. ආර්යාෂ්ඨාංගික මාර්ගය නිවන සඳහා මිස ආර්ය ගෝත්‍රයෙහි සුබ විහරණය සඳහා නො වී ය. එමෙන් ම කිසිවකු උපතින් බමුණෙකු වන්නේ නැතැයි ද බුදුන් වහන්සේ වදාළහ.

© Prof. Nalin De Silva

මෙයින් පැහැදිළි වන්නේ බුදුන් වහන්සේ ආර්ය වෛදික සමාජය උඩු යටිකුරු කිරීමට කටයුතු කළ බව ය. බුදුන් වහන්සේ තරම් ආර්යයන්ට සංස්කෘතික ව පහර දුන් වෙනත් කිසිවෙක් නො වූහ. බුදු දහම අනාර්ය සංස්කෘතියෙහි උපත ලබා ඉන් පසු ඒ අනාර්ය සමාජය හා සංස්කෘතිය පමණක් නොව ආර්ය සංස්කෘතිය හා සමාජය ද වෙනස් කෙළේ ය. බිලි පූජා කළ වෛදිකයන් පසු කලෙක අවිහිංසාව දෙසට යොමු කරනු ලැබුයේ බුදු දහම විසිනි. අප අපේ ප්‍රවාද නිර්මාණය කරන්නේ චක්‍රිය චින්තනයක ය. A විසින් B මත ද B විසින් C මත ද C විසින් A මත ද බලපෑම් ඇති කිරීම රේඛීය චින්තනයකට පටහැණි වුව ද චක්‍රීය චින්තනයකට පටහැණි නො වෙයි.

වත්මන් බටහිර සමාජය ආරම්භ වූයේ කෙසේ ද යන්නත් එහි අරමුණක් ලෙස තම සංස්කෘතිය, ආර්ථිකය හා දේශපාලනය (වුහ) අනෙක් රටවලට හා සමාජවලට බලයෙන් හෝ වෙනත් ක්‍රමයකින් හෝ පැටවීමත් පිළිබඳ අපට අපේ ම වූ ප්‍රවාද ඇත. බටහිර යටත්විජිවාදය පැතිරවීම බටහිර සංස්කෘතියේ අංගයක් පමණක් වෙයි. බටහිර සංස්කෘතික, ආර්ථික හා දේශපාලන යටත්විජිතවාදයේ මුල එතැන ය. කාල් මාක්ස් පඬිවරයා මේ සියල්ල ආර්ථිකයට ඌනනය කිරීමට උත්සාහ ගත්තේ ය. ඔහු යටත්විජිතවාදයත් පසු කලෙක ලෙනින් පඬිවරයා අධිරාජ්‍යවාදයත් විස්තර කෙළේ ආර්ථික කරුණු පදනම් කරගෙන ය.

එහෙත් සියල්ල ආර්ථිකයට ඌනනය කිරීම කළ හැක්කක් නො වේ. මාක්ස්වාදය රේඛීය චින්තනය මත පදනම් වෙයි. එහෙත් ඇතැම් අවස්ථාවක ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්නනයෙන් කැඩීමට ද මාක්ස්වාදය විසින් උත්සාහ ගෙනු ලැබ ඇත. ග්‍රීක යුදෙව් චින්තනයෙන් කැඩී යුරෝපිය සන්දර්ශයෙහි මාක්ස් පඬිවරයාට යෑමට තිබුණේ එක් චින්තනයක් වෙත පමණකි. ඒ කතෝලික චින්තනයයි. මාක්ස්වාදය මෙන් ම ෆැසිස්ට්වාදය ද කතෝලික චින්තනය මත පදනම් වෙයි. යුරෝපීය සන්දර්භයෙහි ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට අභියෝග එල්ල වූයේ කතෝලික චින්තනයෙන් පමණකි. එහෙත් ඒ චින්තනය පහළොස්වැනි සියවසේ සිට ම පරාජය ලබමින් තිබුණි. කතෝලික චින්තනය මත පදනම් වූ මාක්ස්වාදයත් ෆැසිස්ට්වාදයත් අවසානයේ දී බටහිර ක්‍රිස්තියානි නූතනත්වයට පරාජය වීම පුදුමයක් නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva